# නිදහස් අධ්‍යාපනය මල්පල ගැන්වූ සංකල්පය

"බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ අධ්‍යාපනය දීම" බොහෝ දියුණු රටවල්ද අභිභවා යමින් අපේ රට ලැබූ විශිෂ්ට සුබසාධක ජයග්‍රහණයක්. එහෙත් එහි නියම පල අප ලබාගෙන ඇතිදැයි විමසිය යුතු කරුණකි. කෙසේ වෙතත්, විශේෂයෙන් විශ්ව විද්‍යාලයට පැමිණෙන සිසුන්ගේ බහුතරය වන පිටිසර සාමාන්‍ය ජනතාවගේ දරුවනට ආර්ථික ප්‍රශ්න නිසා මෙම මහඟු වරප්‍රසාදය භුක්ති විඳීමේදී නිසැකයෙන්ම බාධා ඇතිවුනා.

සරසවි මාවතට පිවිසෙන්නේ සමහරවිට තම දෙමව්පියන් සතු වතුපිටි ඉඩකඩම් ආදී දේපළ පවා උගස් කරමින්. කුසලතාවන් තිබෙපීක ආර්ථික දුෂ්කරතා ඇති මෙවැනි ශිෂ්‍යනගේ උසස් අධ්‍යාපන කටයුත්ත සාර්ථක කරලීමට දියත්කර ඇත. මූල්‍ය පහසුකම් ලබාදීමේ ඩැඩපිළිවෙල ඔවුනට ඇත්තෙන්ම දේවාශීර්වාදයක්.

මේ කටයුත්තේ මුල්ම දයකයා වුණේ මහජන බැංකුව. 1964 දී මහජන බැංකුව විසින් විශ්ව විද්‍යාල ශිෂ්‍යනට ණය පහසුකම් ලබාදීම අරඹනු ලැබුවා. සාමාන්‍ය ගනුදෙනුකරුවන්ට ණය නිකුත් කරන නීති රීති පද්ධතියට අනුව ශිෂ්‍ය ණය දීම මහජන බැංකුවේ පිළිවෙත වුණත් සියයට පහක සහනදායක පොලියකුයි ශිෂ්‍යයන්ගෙන් අයකලේ. එහෙත් මෙම ණය මුදල් ලබාගැනීමට හැකි වුණේ බැංකුවට පිළිගැනීමට පුළුවන් ඇපකරුවන් දෙදෙදෙනෙක් ඉදිරිපත් කිරීමෙන් පමණයි.

පසුව 1972 දී අංක 04 දරණ ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල් පනත සම්මත වුණා. ඒ අනුවයි විශ්ව විද්‍යාලවලට මෙන්ම අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට ශිෂ්‍ය ණය වාණිජ බැංකු මගින් නිකුත් කිරීමට පියවර ගත්තේ 'පනතින් පසු බැංකුවෙන් ණය ලබාගැනීමේදී බැංකුවම පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම වෙනුවට මව හෝ පියා හෝ භාරකරු හෝ ඇපකරු වශයෙන් ඉදිරිපත් කිරීමට හැකිවුණා මේ නිසා අඩු ආදයම් ලබන කාහටත් ශිෂ්‍ය ණය ලපාගැනීමට මග පෑදුනා. ශිෂ්‍ය (උසස් අධ්‍යාපන) ණය අරමුදල් පනත සම්මත වූ පසු මේ මහඟු කර්තව්‍යයට තවත්



මහපොල උළෙලකට පැමිණි සිටි අමුත්තන් පිරිසක්

# සරසවි සිසුන්ගේ ණයවලට විකල්පයක්


හිතවතෙකු එක් වුණා ඒ ලංකා බැංකුව. පනතින් පසු රජයේ අවධානයෙන් ද යුතුව මුල්ම ණය නිකුත් කළේ 1973 වර්ෂයේ ලංකා බැංකුව මගින්. එතැන් සිට මේ දක්වාම බැංකු දෙකම හවුල්වී ණය සැපයීම කරන්නේ වසරෙන් වසර මාරුවෙන් මාරුවට එනම් එක් වර්ෂයක අළුතෙන් ඇතුළුවන ශිෂ්‍යයන් සඳහා ලංකා බැංකුවත්, ඊළඟ වර්ෂයේ අලුතෙන් ඇතුළුවන ශිෂ්‍යයන් සඳහා මහජන බැංකුවත් ලෙස.

★

1964 දී මුලින්ම මහජන බැංකුව ශිෂ්‍ය ණය නිකුත් කිරීමේදී එක් අයකුට වර්ෂයකටම ලැබුණේ රුපියල් 750/- යි. ජීවන වියදම ඉහළ යාමත් සමඟ අද ඒ මුදල වර්ෂයකටම රු: 2250 ක උපරීමයකට යවත් (ශිෂ්‍ය ණය වසරකට මාස 10 ක නිකුත් කරනවා.) 101 /2% සහනදයී පොළියක් මත මෙම ණය ක්‍රමය කොටස් තුනකින් සමන්විතයි. ණය ප්‍රමාණය තීරණය වන්නේ පදිංචි ස්ථානයේ සිට විශ්ව විද්‍යාලයට ඇති දුර, පවුලේ ආදයම් තත්ත්වය පවුලේ සංඛ්‍යාව ආදී කරුණු පදනම් කරගෙනයි.

★

සිසුන්ට සහන සලසා ඇත්තේ ණය ලබාගැනීමේදී පමණක් නොවෙයි. ණය ආපසු බැංකුවට ගෙවීමේදීක් පහසුකම් ලබාදී තිබෙනවා. විශ්ව විද්‍යාලයෙන් පිටවී රැකියාවක් ලබාගත් වහාම. ඒ පිළිබඳ විස්තර ණය ගත් බැංකුවම දැන්විය යුතු වෙනවා. ඉන්පසු සාධාරණ මුදලක් වැටුපෙන් බැංකුව විසින් මාස්පතා අයකරගන්නවා. රැකියාව ලැබී මාස හතරක් පමණ ගතවූ පසුයි නැවත අයකර ගැනීම අරඹන්නේ. එවිට ගත් ණය ප්‍රමාණය පොලියත් සමඟ ගෙවිය යුතුයි.



නිර්මාතෘවරයා
ජනාධිපතිතුමා සමඟ

# දුප්පත් සිසුන්ට සහන රැසක්

වාණිජ බැංකු දෙකම පවසන්නේ නැවත ණය ගෙවීම ඉතාමත් දුර්වල මට්ටමක ඇති බව. ලංකා බැංකුව දැනට (1983 දෙසැම්බර් තෙක්) ණය දුන් ප්‍රමාණය රු: මිලියන 100, 441.523. 10 ක් නමුත් අයවී ඇති ප්‍රමාණය රු: මිලියන 14, 958, 837.24ක් මහජන බැංකුව නිකුත්කළ ණය ප්‍රමාණය දල වශයෙන් ලක්ෂ 910 ක්. එහෙත් අයවී ඇති ප්‍රමාණය දල වශයෙන් ලක්ෂ 139 යි. මේ අනුව පෙනියන්නේ ණය | දුන් මුදලෙන් අයවී ඇත්තේ 14% 15% ක් පමණ බව.


මෙසේ දුන් ණය නැවත නොගෙවීමට හේතු කීපයක් ම ඇති බව එම බැංකු පවසනවා. ඒවානම් විශ්ව විද්‍යාලයෙන් පිට වූ පසු බැංකුව සමඟ ඇති සම්බන්ධතාව අත්හැර දැමීම. රැකියාවක් ලැබුණු පසු බැංකුවට නොදැන්වීම. අඩු පොලියක් නිසා හැකිතාක් කල් නොගෙවා සිටීමට උත්සාහ දැරීම පෞද්ගලික අංශයේ හා ස්වයං රැකියාවන්හි නිරත නිසා තොරතුරු සපයාහැනීමේ අපහසුව. රැකියා ලැබුනත් ආර්ථික දුෂ්කරතා ඇතිවීම විදේශගතවීම ආදිය.

සිසු ප්‍රශ්න මෙසේ උග්‍ර වෙද්දේ, විශ්ව විද්‍යාල වලට සම්බන්ධ නොවන තවත් වැදගත් ව්‍යාපාරයක් රට තුළ ආරම්භ වුනා. ඒ පාරිභෝගිකයාට අධ්‍යාපනයක් ලබාදීමේ අරමුනෙ එවකට වෙළෙඳ හා නාවික ඇමතිව සිටි වත්මන් ජාතික ආරක්ෂක අමාත්‍ය ලලිත් ඇතුලත්මුදලි මහතාගේ නිර්මාතෘත්වයෙන් ඇරඹුන මහ පොල සංකල්පය. මෙම සංකල්පය බිහිවීමටත් හේතුවූනේ උදාර පරමාර්ථයක් වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව එතෙක් පටු සීමාවන් වල වෙලී තිබුන ආර්ථිකයේ නිම වලලු පුළුල් වී රට තුළ නව ආර්ථික රටාවක්



මහපොල ශිෂ්‍යත්ව උළෙලකට සහභාගිවූ සිසුන් පිරිසක්.

# නගරයේ වරප්‍රසාද ගමට ගෙනයයි



බිහි වුනා. එතෙක් ඒකාකාරී ස්වරූපයක් ගත් වෙළෙඳාම, තවත් ව්‍යාප්තවී, බොහෝ ආර්ථික විද්‍යාඥයන්ගේ පැසසුමට පාත්‍රවන තරඟකාරිත්වය, අපේ වෙළෙඳ පොලේ මිල තීරණය කරන බල වේගය බවට පත්වුනා. නව වෙළෙඳ භාණ්ඩ, විදේශීය රටවල නව නිෂ්පාදන අපේ පාරිභෝගික-යාට හඳුන්වා දෙනු ලැබුවා.

ඒ සමඟම රජය මගින්, වෙළෙඳුන්ගේ ගසා කෑම වලින් පාරිභෝගිකයා ආරක්ෂා කරනු පිණිස, සමස්ත ජනගහනය වන පාරිභෝගික ජනතාව නගා සිටුවනු පිණිස "පාරිභෝගික" ආරක්ෂක පනත නීති ගත කරනු ලැබුවා. මෙම පනත මගින්, වෙළෙඳ පොල පාලනය කිරීමට පාරිභෝගික ජනතාවට අසීමිත බලයක් ලබා දෙනු ලැබුවා. වත්මන් රජයේ අනුග්‍රහය මත පාරිභෝගික ජනතාවට සැළසුන පහසුකම් වැඩිපුරම ලැබුනේ නගරයේ ජනතාවට වීම කනගාටුදායක කරුණක්. මේ නිසා මෙරටේ සාමාන්‍ය ජනතාව වෙතට මෙම වරප්‍රසාද ගෙනයාමේ අවශ්‍යතාවය ඇති වුනා. ඒ අරමුණ ඉටුකිරීම සඳහා නගරයේ පෞද්ගලික වෙළෙඳ ආයතන හා රාජ්‍ය සංස්ථා ගමට ගෙන යාමේ අරමුණින් මහපොල 1970 දශකයේ අග-භාගයේදී ආරම්භ කෙරුනා.

මහපොල ගමින් ගමට යද්දී එය පැවැත්වීමට ඉඩකඩ සැළසුනේ එම ප්‍රදේශයේ පාසැල් වලයි. එහෙයින් එම උත්සව භූමියට ඇතුළත්වීමට අය කරගන්නා ගාස්තුව (රු. 2 ක්) එකතු කර ලැබෙන මුදල එම පාසැලේ හෝ ආයතනයේ දියුණුවට උපයෝගි කරගැනීමට පරිත්‍යාග කිරීමට ඇමති-වරයා අදහස අනුව තීරණය වුනා.

මේ අතර ඇමතිවරයා තුළ ඇතිවූ එක් අදහසක් නම් මේ රටේ උසස් අධ්‍යාපනය ලබන තරුණ තරුණියන්ගේ අධ්‍යාපන කටයුතු වලට අතදීම. ආර්ථික දුෂ්කරතා නිදහස් අධ්‍යාපනයේ නියම පල-නෙලා ගැනීමට අපේ රටේ පොදු ජනතාවගේ දරුවනට ඉඩ අසුරන බව දැනගත් ඇමතිවරයා, සිය පෞද්ගලික අරමුදලින් එක් ශිෂ්‍යත්වයක්

# දක්ෂයන්ටත් නියම තෑග හිමිකිරීමක්

ප්‍රදානය කිරීම තුළින් එම අදහස ක්‍රියාත්මක කළා. මෙම අදහසෙහි අගය තේරුම්ගත් දනපතියන්ද මෙම උතුම් උතුම් ක්‍රියාවට එක්වීමෙන් අරමුදලක් ගොඩ නැඟුනා. ඉන් පසුව මහපොල ලොතරැයියේ ටිකට් පත් විකිණීමෙන් ලැබුන මුදලද එක්වීමෙන් මෙම අරමුදල දැන් රුපියල් කෝටි 10 දක්වා වැඩිවී තිබෙනවා.

මහපොල ශිෂ්‍යත්ව දෙන්නේ කෙලින්ම එම අරමුදලින් නොවේ. 45,000 ක වටිනාකම ඇති මුදලක් එක් ශිෂ්‍යත්වයක් සඳහා වෙන් වෙනවා. එම මුදල බැංකුවේ තැන්පත් කරනු ලබන අතර, මෙම ශිෂ්‍යත්ව සඳහා බැංකු මගින් විශේෂයෙන්ම දෙනු ලබන පොලිය මගිනි. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ.

මහපොළ ශිෂ්‍යත්වයේ තිබෙන විශේෂත්වය නම්, ආර්ථික අතින් අගහිඟකම් තිබෙන අයට පමණක් නොව උපරිම කුසලතා පෙන්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ශිෂ්‍යත්ව ලාභීන් වීම. අධ්‍යයන වර්ෂයකම කුසලතා මත පදනම් කර ගැනීමෙන්, ශිෂ්‍යත්ව සියයට පහළොවක් දෙනු ලබනවා. දක්ෂ-



ප්‍රදර්ශනාගාරයතුළදී පැලෑටි පිළිබඳව පාරිභෝගිකයන්ගේ විමසිල්ල.

# සියළු සරසවි සිසුන්ට යහපත් අනාගතයක්

තාවය මත පදනම් වූ මේ ශිෂ්‍යත්ව සියයට පහළොවක් දෙනු ලබනවා දක්ෂතාවය මත පදනම් වූ ශිෂ්‍යයත්ව ලාභීනට සම්පූර්ණ උසස් අධ්‍යාපන කාලය තුළදී. මසකට රුපියල් හාරසියය බැගින් වර්ෂයකට රුපියල් හාරදහසක මුදලක් ලැබෙනවා, දක්ෂකම් පෙන්වන අගහිඟකම් ඇති අතිකුත් ශිෂ්‍යයන්ට ලැබෙන මුදල මසකට රුපියල් තුන්සිය පනහක්.

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ මංගල උත්සවය පැවැත්වූයේ 1981 නොවැම්බර් 14 වැනිදා. එදින සිසුන් 411 දෙනෙකුට නම් ශිෂ්‍යත්වයේ කුළුදුල් ප්‍රතිලාභීන් වීමේ භාග්‍ය ලැබුණා. ඔවුන් ගෙන් 365 දෙනෙකු මුදල් අවශ්‍යතාවේ පදනම මතත් 45 දෙනෙකු උසස්ම ලකුණු ලබා ගැනීම පදනම මතත් තෝරා ගනු ලැබුවා මේ වනවිට මහපොළ ශිෂ්‍යත්වයේ පිහිට අධ්‍යයන වර්ෂ තුනක සිසු සිසුවියන්ට ලැබුණා. එනම් 81 - 82, 82 - 83, 83 - 84 යන අධ්‍යයන වර්ෂ 411 ක් වැනි සුළු පිරිසකට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් ගමන් ඇරඹුවත්, මහපොළ සංකල්පයේ නිර්මාතෘ ගරු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාගේ ඉලක්කය විශ්වවිද්‍යාලයට ඇතුළත්වන සෑම අයකුටම මහ පොළ ශිෂ්‍යත්වයක් ලබාදීම. 1982 වසර සඳහා ශිෂ්‍යත්ව 1001 ක්ද, 1983 වසර සඳහා ශිෂ්‍යත්ව 2500 ක්ද ප්‍රදානය කළා. 1984 වර්ෂයේ සිසුන් 3000 ක් ශිෂ්‍යත්ව ලාභීන් කරලීමටයි. ඇතුලත්මුදලි ඇමතිතුමාගේ අදහස මහපොළ ශිෂ්‍යත්ව දැනට විශ්වවිද්‍යාල සිසුන්ට පමණක් සීමා වුවත් නොබෝ දිනකින් අතිකුත් උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන සිසුන්ටත් මහපොළ ශිෂ්‍යත්ව ලාභීන්වීමේ භාග්‍යය උදාවනවා. ඒ විතරක් නෙවෙයි, ජනාධිපති අරමුදල හා මහපොළ උසස් අධ්‍යාපන භාරකාර අරමුදල එක්වී විදේශීය විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන්ටත් මහ පොළ ශිෂ්‍යත්වයෙන් උපකාර කිරීමේ නව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමටයි අනාගත බලාපොරොත්තුව.

